වාර්ෂික වාර්තාව
2023



වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
(PGIMS)

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

පටුන

1. සංවිධානාත්මක ව්‍යුහය 2
2. අධ්‍යක්ෂකවරයාගේ සමාලෝචනය 3
3. දැක්ම සහ මෙහෙවර 4
4. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිළිබඳ දළ විශ්ලේෂණය 5
5. කළමනාකරණ මණ්ඩලය 7
6. අනුබද්ධ අධ්‍යයන මණ්ඩල 8

6.1 සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය 8

6.2 ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය 8

6.3 මූලික වෛද්‍ය විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය 9

6.4 සායනික විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය 9

7. සංඛ්‍යාලේඛන 10


ශිෂ්‍යයින් 10

කාර්ය මණ්ඩලය 10

ආරම්භ කරන ලද නව පාඨමාලා 11

8. 2023 වසරේ සමස්ත කාර්ය සාධනය 12
9. තිරසාරභාවය මත පදනම් වූ අනාගත ප්‍රක්ෂේපන වාර්තාව 13
10. විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව 14
11. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 17
12. විගණකාධිපතිවරයාගේ වාර්තාව 36
13. විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු 41

1. <u>සංවිධානාත්මක ව්‍යුහය</u>



2. අධ්‍යක්ෂකවරයාගේ සමාලෝචනය



2023 වසර පුරාවට වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මුහුණ දුන් අභියෝග මෙන්ම අත්කරගත් ප්‍රගතිය පිළිබඳ දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම ඉමහත් සේ සතුටු වෙමි.

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති සහ කළමනාකරණ මණ්ඩලයේ ප්‍රධාන සාමාජිකයින් ඇතුළු සම්භාවනීය පිරිසකගේ සහභාගීත්වය මධ්‍යයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් නව උපාධි වැඩසටහන් දෙකක් ආරම්භ කරමින් ඉතා සාධනීය අයුරින් වසරේ කටයුතු ආරම්භ කරනු ලැබීය. මෙම සුවිශේෂී අවස්ථාව අපගේ ගමනේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. මෙම වැඩසටහන් ආරම්භයත් සමඟම, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් උද්යෝගිමත් සිසුන් 50කට අධික සංඛ්‍යාවක් ඊට සම්බන්ධ කර ගනු ලැබූ අතර එය අධ්‍යයන ප්‍රජාව තුළ අප ආයතනය සම්බන්ධයෙන් වර්ධනයවන පිළිගැනීම සහ ආකර්ෂණය පිළිබඳ මනා සාක්ෂියකි.

අප රට තුළ ආර්ථිකමය වශයෙන් පැවැති අවිනිශ්චිතතාවය මධ්‍යයේ වුවද, එවැනි සන්ධිස්ථානයක් අත්කර ගැනීම මගින් අධ්‍යයන විශිෂ්ටත්වය සහ ශිෂ්‍ය සුභසාධනය අරභයා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි කැපවීම සහ ඔරොත්තු දීමේ හැකියාව සහ මැනවින් අවධාරණය කරයි. මෙම ජයග්‍රහණය හුදෙක් සංඛ්‍යාත්මක අගයක්ම නොව ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සහ අපගේ සිසුන්ගේ බුද්ධිමය වර්ධනය පෝෂණය කිරීම සඳහා වන අපගේ අචල කැපවීම පිළිබිඹු කිරීමකි.

කෙසේ වෙතත් වසර තුළ අප මුහුණ දුන් අභියෝගවලට විසඳුම් සෙවීම අත්‍යවශ්‍ය කරුණක් විය. අප උපරිම අයුරින් උත්සාහ කළ නමුදු, අපගේ මාණ්ඩලික සේවක සංඛ්‍යාව පුළුල් කිරීමේදී විශේෂයෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ සහකාර මූල්‍යාධිකාරී වැනි තනතුරු සම්බන්ධයෙන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට බාධාවන්ට මුහුණ දීමට සිදුවිය. කාර්ය මණ්ඩලයේ මෙම හිඟය සැලකිය යුතු මෙහෙයුම් දුෂ්කරතාවයන්ට හේතු වී ඇති අතර, එමගින් පවත්නා සම්පත් මත අමතර පීඩනයක් ඇති කරයි. එමෙන්ම අපගේ මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය කෙරෙහිද එය අනර්තකාමී බලපෑම් එල්ල කරයි. මෙම තත්ත්වය නිවැරදි කිරීමේ හදිසි අවශ්‍යතාවය අප විසින් හඳුනාගෙන අපගේ කාර්ය මණ්ඩල අවශ්‍යතා සපුරාලීම සඳහා වන මාර්ග පිළිබඳව ක්‍රියාකාරී ලෙස ගවේෂණය කරමින් සිටිමු.

අපි මෙම අභියෝග හමුවේ ඉදිරියට ගමන් කරන විට හමුවන බාධක ජය ගෙන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය අඛණ්ඩ සාර්ථකත්වය කරා රැගෙන යාම සඳහා අප කණ්ඩායම සතු සාමූහික අධිෂ්ඨානය සහ හැකියාවන් පිළිබඳව මම විශ්වාස කරමි. විශිෂ්ටත්වයට පත්වීම සඳහා අපගේ කැපවීම නොසැලී පවතින අතර අධ්‍යයන ප්‍රගතිය සහ ආයතනික සංවර්ධනය සඳහා අපගේ ප්‍රයත්නයන් තුළ අපි ස්ථිරව කටයුතු කරන්නෙමු.

මෙතෙක් අප ලද ජයග්‍රහණ උදෙසා දක්වන ලද අචල සහයෝගය සහ කැපවීම සම්බන්ධයෙන් පීඨයට, කාර්ය මණ්ඩලයට, සිසුන්ට සහ පාර්ශවකරුවන්ට මම මගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි. අධ්‍යාපන කටයුතු සහ පර්යේෂණවල විශිෂ්ටත්වය පිළිබඳ අපගේ සාමූහික දැක්ම පෙරදැරිව අධිෂ්ඨානයෙන් යුතුව ඔරොත්තු දීමේ හැකියාවෙන් සන්නද්ධව අපි එක්ව ඉදිරියට යමු.

මහාචාර්ය (වෛද්‍ය) සමන් ඩී ධර්මරත්න
අධ්‍යක්ෂක
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

3. දැක්ම සහ මෙහෙවර

දැක්ම

ශ්‍රී ලංකාවේ, ආසියාවේ සහ සමස්ත ලෝකයේම පශ්චාත් උපාධි වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව ජාත්‍යන්තරව පිළිගත් සහ ප්‍රතිතනය ලත් විශිෂ්ටතා මධ්‍යස්ථානයක් බවට පත් වීම.

මෙහෙවර

තිරසර අධ්‍යාපනය, පර්යේෂණ සහ නවෝත්පාදන තුළින් ශ්‍රී ලංකාවේ ජනතාවට ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් සැපයීම පිණිස වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, පිරිනැමීම, අධීක්ෂණය සහ ඇගයීම.

ඉලක්ක

- පහසුකම් සංවර්ධනය කිරීම
- කාර්යක්ෂම පරිපාලන හා මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම
- අධ්‍යයන වැඩසටහන් ස්ථාපිත කිරීම
- අන්‍යෝන්‍ය ගෞරවය, සමාජ සංවේදීතාව සහ වෘත්තීයභාවය මත පදනම් වූ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම
- ක්‍රියාශීලී පර්යේෂණ සංස්කෘතියක් සහ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් ඇති කිරීම
- විනිවිදභාවය සහ යහපාලනය පවත්වාගෙන යාම

හර වටිනාකම්

- සම අවස්ථා
- ශාස්ත්‍රීය සමෝධානය සහ වෘත්තීයභාවය
- දැනුම සොයායාම පිළිබඳ දැඩි කැපවීම
- සමාජ සංවේදීතාව සහ අන්‍යෝන්‍ය ගෞරවය
- විවිධත්වය සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස
- ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහ කළමනාකරණය
- මෙහෙයුම් සම්බන්ධයෙන් වගවීම සහ විනිවිදභාවය

4. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිළිබඳ දළ විශ්ලේෂණය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24A (1) වගන්තිය යටතේ 2019 සැප්තැම්බර් 9 වැනි දින ආරම්භ කරන ලද අතර එය 2019 අංක 2141/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලදී. මෙය ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ.

ආයතනයේ බලධාරීන් වන්නේ: -

(අ) කළමනාකරණ මණ්ඩලය
(ආ) අධ්‍යයන මණ්ඩල සහ
(ඇ) එවැනි අධිකාරීන් බවට ආඥාපනත මගින් නියම කරනු ලැබිය හැකි වෙනත් ආයතන.

ආයතනය විසින් පහත සඳහන් එක් එක් වෛද්‍ය විද්‍යා විශේෂඥ ක්ෂේත්‍ර සඳහා අධ්‍යයන මණ්ඩල පිහිටුවා ඇති අතර, කළමනාකරණ මණ්ඩලයේ සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කළ යුතු ඉගැන්වීම් සහ පුහුණුව ලබාදීමට අපේක්ෂා කරන වෛද්‍ය විද්‍යා විශේෂඥ ක්ෂේත්‍ර සඳහා වෙනත් මණ්ඩල ස්ථාපිත කරනු ලැබිය හැක.

(අ) සායනික විද්‍යා;
(ආ) මූලික වෛද්‍ය විද්‍යාව;
(ඇ) ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව; සහ
(ඈ) සෞඛ්‍ය විද්‍යාව

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 2023 වර්ෂයේදී මහජන සෞඛ්‍ය පිළිබඳ විද්‍යාපති (MPH) සහ ව්‍යායාම සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ විද්‍යාපති (MSc. ESS) යන උපාධි වැඩසටහන් හඳුන්වා දීමත් සමඟ එහි අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී. උපාධි පාඨමාලා දෙකම සඳහා පළමු ශිෂ්‍ය කණ්ඩායම 2023 අප්‍රේල් මාසයේදී ඇතුළත් කර ගන්නා ලදී.

පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම (2022-2026) කෙටුම්පත් කර එය කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමත කරන ලදී. උපායමාර්ගික සැලැස්ම මඟින් ඉගැන්වීමේ හා පර්යේෂණවල ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය වැඩිදියුණු කිරීම; පරිපාලන හා මූල්‍ය කළමනාකරණයේ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම; සහ යහපාලනය සහ සදාචාරාත්මක පැවැත්ම ශක්තිමත් කිරීම යන ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර තුනක් යටතේ ඉලක්ක 6ක් ඉදිරිපත් කර ඇත. උපාය මාර්ගික සැලැස්ම 2022-2026 පහත සඳහන් ඉලක්ක හයක් යටතේ උපාය මාර්ග තිස් එකක් සහ අරමුණු දහතුනක් යටතේ ක්‍රියාකාරකම් හතළිස් අටක් ක්‍රියාත්මක කරනු ඇත.

- පහසුකම් වැඩිදියුණු කිරීම
- කාර්යක්ෂම පරිපාලන හා මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම
- අධ්‍යයන වැඩසටහන් සකස් කිරීම
- අන්‍යෝන්‍ය ගෞරවය, සමාජ සංවේදීතාව සහ වෘත්තීයභාවය මත පදනම් වූ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම
- ක්‍රියාශීලී පර්යේෂණ සංස්කෘතියක් සහ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා කාර්යක්ෂම පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම
- විනිවිදභාවය සහ යහපාලනය පවත්වාගෙන යාම

උපායමාර්ගික සැලැස්මේ අන්තර්ගත ක්‍රියාකාරකම් ධනාත්මක අයුරින් ක්‍රියාත්මක කිරීම මඟින් මෙම ආයතනය ශ්‍රී ලංකාවේ, ආසියාවේ සහ ලෝකයේ පශ්චාත් උපාධි වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තරව පිළිගත් සහ ප්‍රතීතනය ලත් විශිෂ්ටතා මධ්‍යස්ථානයක් බවට පත්වීමට පහසුකම් සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ආයතනය පහත දැක්වෙන විෂය ක්ෂේත්‍ර අනුව උපාධි වැඩසටහන් පැවැත්වීමට අපේක්ෂා කරයි.

කෙටි පාඨමාලා
ශාස්ත්‍රපති
දර්ශනපති සහ
දර්ශන ශූරී පඨමාලා

මුඛ වෛද්‍ය විද්‍යාව සහ මුඛ විකිරණවේදය පිළිබඳ ශාස්ත්‍රපති (එක් අවුරුදු වැඩසටහන) සහ මුඛ වෛද්‍ය විද්‍යාව සහ මුඛ විකිරණවේදය පිළිබඳ විද්‍යාපති උපාධිය (දෙවසරක වැඩසටහන) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත මාරු කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) අනුමැතිය ආයතනය බලාපොරොත්තුවෙන් සිටී. මෙම වැඩසටහන් 2024 දී ආරම්භ කිරීමට ආයතනය අරමුණු කරයි.

ආයතනය සිය පශ්චාත් උපාධි පිරිනැමීමේ කර්තව්‍යය වඩා පුළුල් කිරීම සහ විවිධාංගීකරණය ඇතිකිරීම අරමුණුකොට ඉහත අපේක්ෂිත වැඩසටහන් සඳහා ප්‍රවේශය පුළුල් කිරීමට සහ අන්තර්විෂයීක සහ බහුවිෂයීක වැඩසටහන් පිළිබඳ අවධානය යොමු කරමින් නව පාඨමාලා හඳුන්වා දීමට එහි සැලසුම් පවත්වා ගෙන යනු ලැබේ. ආයතනය විසින් උපායමාර්ගික සැලැස්මට අනුකූලව අවශ්‍ය පරිදි නව උපාධි වැඩසටහන් සකස් කරනු ලබයි. ආයතනය ශ්‍රම බලකාය සඳහා නවමු කෙටිකාලීන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධවී කටයුතු කරනු ඇත.

පසුබෑම් සහ ඒ සඳහා තුඩුදුන් හේතු

මුලදී මහජන සෞඛ්‍ය පිළිබඳ විද්‍යාපති උපාධිය සහ ව්‍යායාම සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය යන උපාධි පාඨමාලා 2022 වර්ෂයේ දී පිරිනැමීමට සැලසුම් කරන ලද නමුත් එම පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලැබුණේ 2023 වර්ෂයේදීය. එම නිසා උපාධි පාඨමාලා දෙකේ අධ්‍යයන කටයුතු 2023 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.

අලුතින් පිහිටුවන ලද ආයතනයක් වශයෙන්, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට මූල්‍ය බාධක කිහිපයකට මුහුණ දීමට සිදුවී ඇත. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට පුද්ගලික වැටුප් සඳහා පමණක් අරමුදල් ලැබෙන අතර අනෙකුත් ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් දැරීම ආයතනය විසින් උපයාගත් අරමුදල් හරහා සිදු කෙරේ.

තවද, දේශන පැවැත්වීම සඳහා අවශ්‍ය පන්තිකාමර පහසුකම් ආයතනයට නොමැති අතර එම හේතුව නිසා භෞතික දේශන පැවැත්වීම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අනෙකුත් පීඨවල සිදුකරනු ලැබේ. රටේ පවතින මූල්‍ය අර්බුදය හේතුවෙන් 2023 වර්ෂයේදී එම ආයතනයට ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන් කර නොතිබූ අතර උපයාගත් අරමුදල් හරහා කාර්යාලීය ගෘහභාණ්ඩ ඇතුළු අත්‍යාවශ්‍ය උපකරණ මිලදී ගැනීමට ආයතනය කටයුතු කරන ලදී. ඒ සියලු කටයුතු සමඟ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් අවශ්‍ය වෙනස්කම් සිදුකරමින් සිය කටයුතු පවත්වාගෙන යන ලදී.

5. කළමනාකරණ මණ්ඩලය

S. N	සාමාජිකයාගේ නම	සම්බන්ධතාවය
1.	මහාචාර්ය සමත් ඩී .ධර්මරත්න	අධ්‍යාක්ෂ, වෛ.වි.ප.උ.ආ, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2.	ආචාර්ය ඊ.එම්.පී.සී.එස් .ඒකනායක	පීඨාධිපති, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය ,
3.	මහාචාර්ය එම්.ඩී.එම්.අයි.ඩී.කේ . යටවර	පීඨාධිපති, සම සෞඛ්‍ය විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
4.	මහාචාර්ය කේ.ඒ.එස්.එස් . කොඩිතුවක්කු	පීඨාධිපති, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
5.	ආචාර්ය යූ.අයි .දිසානායක	පීඨාධිපති, ඉංජිනේරු පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
6.	මහාචාර්ය එම්.වී.ජී .පින්ටෝ	පීඨාධිපති, වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
7.	මහාචාර්ය ආර්.එච්.කුරුප්පුගේ	පීඨාධිපති, කළමනාකරණ පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
8.	මහාචාර්ය ආර් ජී.එස්.සී .රාජපක්ෂ	පීඨාධිපති, විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
9.	මහාචාර්ය පී.ජී .අනිල් පුෂ්පකුමාර	පීඨාධිපති, පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
10.	මහාචාර්ය මංජුල ආටිගල	පීඨාධිපති, දන්ත වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
11.	ඩබ්ලිව්.කේ.එල්.ඊ .වලල්ලාවිට මහතා	අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන්, (ප්‍රධාන මූල්‍ය නිලධාරි, අධ්‍යාපන අමාත්‍යාංශය)
12.	එච්.එම්.එස් .ධර්මවර්ධන මහතා	මූදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් (අතිරේක අධ්‍යක්ෂ ජනරාල්)
13.	ආචාර්ය සුනිල් ද අල්විස්	සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් (අතිරේක ලේකම්, වෛද්‍ය සේවා, සෞඛ්‍ය අමාත්‍යාංශය)
14.	වෛද්‍ය අසේල ගුණවර්ධන	සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය අමාත්‍යාංශය
15.	ආචාර්ය පණ්ඩුල සිරිබද්දන	කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ වෙනුවෙන් (ජ්යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය)
16.	මහාචාර්ය ඉෂාන් ද සොයිසා	වි.ප්‍ර.කො.ස විසින් නම්කරන ලද (ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය, ශල්‍ය වෛද්‍ය අංශය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය)
17.	මහාචාර්ය ටී .කුමානන්	වි.ප්‍ර.කො.ස විසින් නම්කරන ලද (වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය, වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය, යාපනය විශ්වවිද්‍යාලය)
18.	කමල් පද්මසිරි මහතා	වි.ප්‍ර.කො.ස විසින් නම්කරන ලද (හිටපු ලේකම්, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය)
19.	ආචාර්ය සුරන්ත පෙරේරා	වි.ප්‍ර.කො.ස විසින් නම්කරන ලද (ළමා රෝග විශේෂඥ සහ නවජ රෝග විශේෂඥ, කාසල් වීදියේ කාන්තා රෝහල, කොළඹ)
20.	මහාචාර්ය දේවක කේ වීරකෝන්	වි.ප්‍ර.කො.ස විසින් නම්කරන ලද (සත්ත්ව විද්‍යාව පිළිබඳ ජ්යෙෂ්ඨ මහාචාර්ය, සත්ත්ව විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයනාංශය, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය)
21.	මහාචාර්ය ඩී.එම් .දිසානායක	වෛද්‍ය පීඨය විසින් නම්කරන ලද (ජ්යෙෂ්ඨ මහාචාර්ය, ව්‍යාධි විද්‍යා අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)
22.	මහාචාර්ය අරින්ද ධර්මපාල	වෛද්‍ය පීඨය විසින් නම්කරන ලද (ශල්‍ය වෛද්‍ය මහාචාර්ය, ශල්‍ය වෛද්‍ය අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)
23.	මහාචාර්ය පී.එස්.කේ .නානායක්කාර	වෛද්‍ය පීඨය විසින් නම්කරන ලද (නිර්වින්දන විද්‍යාව පිළිබඳ මහාචාර්ය, නිර්වින්දන හා දැඩි සත්කාර අංශය, වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)
24.	මහාචාර්ය .කපිල ගුණවර්ධන	පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පාලක සභාව විසින් නම් කරන ලද
25.	ජ්යෙෂ්ඨ මහාචාර්ය විද්යා ජ්යෝති වජිර එච්.ඩබ්ලිව් දිසානායක	පාලක සභාව විසින් නම්කරන ලද (පීඨාධිපති, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය)
26.	සමන්ත රත්වත්තේ මහතා	පාලක සභාව විසින් නම්කරන ලද (ජනාධිපති නීතීඥ)
27.	මහාචාර්ය සී.එම්.බී .දෙමටවැව	සම-සාමාජික (අධ්‍යක්ෂක, කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)
28.	මහාචාර්ය ටෙරන්ස් මධුජිත්	සම-සාමාජික (නියෝජ්ය උපකුලපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

6. අනුබද්ධ අධ්‍යයන මණ්ඩල

6.1 සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

අනු අංකය	සාමාජිකයාගේ නම	අනුබද්ධ ආයතනය
1	මහාචාර්ය එච්.එම්.ටී.යූ .හේරත්	සම සෞඛ්‍ය විද්‍යා පීඨය ,පේරාදෙණිය විශ්වවිද්‍යාලය (සභාපති)
2	මහාචාර්ය ඩී.ආර්.ඒ .දිසානායක	පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය ,පේරාදෙණිය විශ්වවිද්‍යාලය
3	ආචාර්ය ආර්.එම්.ආර්.ඩී.බී .රණවීර	ඉංජිනේරු පීඨය ,පේරාදෙණිය විශ්වවිද්‍යාලය
4	ආචාර්ය ඩබ්ලිව්.ආර්.පී .විජේසිංහ	විද්‍යා පීඨය ,පේරාදෙණිය විශ්වවිද්‍යාලය
5	මහාචාර්ය ආර්.එච්.කුරුප්පුගේ	කළමනාකරණ පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
6	මහාචාර්ය සී.එම් .වික්‍රමතිලක	වෛද්‍ය පීඨය ,රුහුණු විශ්වවිද්‍යාලය
7	මහාචාර්ය ගෝමින්ද පොන්නම්පෙරුම	වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
8	ශෂී අලහකෝන් මහත්මිය	සෞඛ්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය
9	මහාචාර්ය බී.ඒ.පී .මෙන්ඩිස්	කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය (ලේකම්)
10	ආචාර්ය ජී .දිසානායක මහත්මිය	ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
11	මහාචාර්ය එල්.පී.එම්.එම්.කේ . පතිරගේ	වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
12	ආචාර්ය සී.එස්.එස්.එස්.කේ . ගමකරණගේ	වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

6.2 ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

අනු අංකය	සාමාජිකයාගේ නම	අනුබද්ධ ආයතනය
1	වෛද්‍ය රලින්ද පල්ලාවල	ශික්ෂණ රෝහල, පේරාදෙණිය (සභාපති)
2	මහාචාර්ය දිලීප ද සිල්වා	දන්ත වෛද්‍ය විද්‍යා පීඨය ,පේරාදෙණිය විශ්වවිද්‍යාලය
3	මහාචාර්ය ජනනී කොට්ටහච්චි	වෛද්‍ය පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
4	මහාචාර්ය ආර්.එච්.ඒ.අයි .රත්නවීර	වෛද්‍ය පීඨය ,රුහුණු විශ්වවිද්‍යාලය
5	මහාචාර්ය ඩිලානි ලොකුහෙට්ටි	වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
6	ආචාර්ය සුමෙත් පෙරේරා	වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකා සබරගමු විශ්වවිද්‍යාලය
7	මහාචාර්ය ටී.සී .අගම්පොඩි	වෛද්‍ය සහ අනුබද්ධ විද්‍යා පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
8	අරුල්නන්දන් මහත්මිය	සෞඛ්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය
9	ආචාර්ය අයි.ඊ .වීරසිංහ	ජාතික රෝහල, මහනුවර
10	ආචාර්ය එස් .කුමරන්	වෛද්‍ය පීඨය ,යාපනය විශ්වවිද්‍යාලය
11	ආචාර්ය ඩබ්ලිව්.එම්.එස්.එන්.කේ . නවරත්න	වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය (ලේකම්)
12	ආචාර්ය නුවනි මනම්පේරි	පරපෝෂිත විද්‍යා අංශය ,වෛද්‍ය පීඨය ,පේරාදෙණිය විශ්වවිද්‍යාලය

6.3 මූලික වෛද්‍ය විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

අනු අංකය	සාමාජිකයාගේ නම	අනුබද්ධ ආයතනය
1	මහාචාර්ය බී.එම්.එච්.එස්.කේ . බන්නෙහැක	දන්ත වෛද්‍ය විද්‍යා පීඨය ,පේරාදෙණිය විශ්වවිද්‍යාලය (සභාපති)
2	ආචාර්ය වරුණි තෙන්නකෝන්	වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
3	මහාචාර්ය එල්.ඩබ්ලිව්.ජී.ආර් . අල්විස්	වෛද්‍ය පීඨය ,රුහුණු විශ්වවිද්‍යාලය
4	ආචාර්ය කුමුදු බණ්ඩාර	ශික්ෂණ රෝහල, පේරාදෙණිය
5	මහාචාර්ය ඩී.ජේ .ඇන්තනි	වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
6	ආචාර්ය එච්.ටී.ඩබ්ලිව් .වීරකෝන්	වෛද්‍ය සහ අනුබද්ධ විද්‍යා පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
7	ආචාර්ය එන්.ඩී.ඒ .වගීෂා	වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකා සබරගමු විශ්වවිද්‍යාලය
8	ආචාර්ය ජේ .මහින්දන්	සෞඛ්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය (ලේකම්)
9	ආචාර්ය සී.ටී .කැප්පෙටියාගම	ජාතික රෝහල, මහනුවර
10	ජ්යෙෂ්ඨ මහාචාර්ය වී .අරසරත්නම් මෙය	වෛද්‍ය පීඨය ,යාපනය විශ්වවිද්‍යාලය
11	ආචාර්ය ටී.ඩී.පී .නන්දදේව	වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
12	ආචාර්ය ශිරෝම් සිරිවර්ධන	ව්‍යූහ විද්‍යා අංශය, වෛද්‍ය පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය
13	ආචාර්ය .ආර්.එම්.පී.එම් .රත්නායකමිය	ශික්ෂණ රෝහල, කුරුණෑගල

6.4 සායනික විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

අනු අංකය	සාමාජිකයාගේ නම	අනුබද්ධ ආයතනය
1	මහාචාර්ය ඩී.ඒ.සී.එල් .දළුගම	වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය (සභාපති)
2	මහාචාර්ය ආර්.ඩී .ජයසිංහ	දන්ත වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය (ලේකම්)
3	මහාචාර්ය ටී.පී .වීරරත්න	වෛද්‍ය පීඨය ,රුහුණු විශ්වවිද්‍යාලය
4	ආචාර්ය එම්.එස් .සන්ධියා බණ්ඩාර	ශික්ෂණ රෝහල, පේරාදෙණිය
5	මහාචාර්ය පූජිත වික්රමසිංහ	වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
6	මහාචාර්ය චමිල් මාරසිංහ	වෛද්‍ය පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
7	ආචාර්ය වී.අයි .ධර්මවර්ධන	වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
8	ආචාර්ය ඒ.එම්.ඒ.එච්.එම්.එස් . සේනානායක	වෛද්‍ය සහ අනුබද්ධ විද්යා පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
9	මහාචාර්ය එම් .උමාකාන්ත්	සෞඛ්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය
10	ආචාර්ය කේ.එච් .එදිරිසිංහ	ජාතික රෝහල, මහනුවර
11	මහාචාර්ය කේ .මුහුන්තන්	වෛද්‍ය පීඨය ,යාපනය විශ්වවිද්‍යාලය
12	මහාචාර්ය ඩී.එම්.පී.යූ.කේ . රලපනාව	වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
13	ආචාර්ය සී.එල් .දන්දෙණිය	වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
14	ආචාර්ය සොබාවි රන්දෙණි	වෛද්‍ය පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය
15	ආචාර්ය ඒ.එම්.එස්.බී .අදිකාරි	ශික්ෂණ රෝහල, කුරුණෑගල

7. <u>සංඛ්‍යාලේඛන</u>

ශිෂ්‍යයින්

පශ්චාත් උපාධි වැඩසටහන සඳහා නවක ප්‍රවේශකයින් සහ බඳවා ගැනීම

පාඨමාලා	එකතුව						ශිෂ්‍ය නිමැවුම **2023**
	නවක ප්‍රවේශකයින්			ශිෂ්‍ය බඳවා ගැනීම			
	පිරිමි	කාන්තා	එකතුව	පිරිමි	කාන්තා	එකතුව	
මහජන සෞඛ්‍ය පිළිබඳ විද්‍යාපති උපාධිය	11	11	22	11	11	22	-
ව්‍යායාම සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය	16	20	36	16	20	36	-
එකතුව	27	31	58	27	31	58	-

කාර්ය මණ්ඩලය

අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය

සේවා කාණ්ඩය		**වැටුප් කේතය**	**අනුමත කාර්ය මණ්ඩලය**	**තත්‍ය කාර්ය මණ්ඩලය**
ජ්‍යෙෂ්ඨ මට්ටම	මහාචාර්ය	U-AC 5	01	01
තෘතීයික මට්ටම	කනිෂ්ඨ විධායක / කළමනාකරුවන්	U-EX 1	02	01
	** අධ්‍යයන සහාය අංශය	Fixed	01	01
ද්විතියික මට්ටම	කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන	U-MN 1	01	01
	කළමනාකරණ සහකාර - තාක්ෂණික	U-MT 1	01	00
උප එකතුව			**06**	**04**

බඳවා ගැනීම් සම්බන්ධයෙන් රට තුළ පවතින අභියෝගාත්මක වාතාවරණය හේතුවෙන්, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා පරිපාලන කාර්ය මණ්ඩලය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වැඩ බලන මූල්‍යාධිකාරීවරයෙකුගෙන් සමන්විත වේ.

** මෙය තාවකාලික පර්යේෂණ සහකාර කාර්යමණ්ඩල පත්කිරීමකි

ආරම්භ කරන ලද නව පාඨමාලා

වැඩසටහන	වැජසටහන් වර්ගය	කාලය	මාධ්‍ය
මහජන සෞඛ්‍ය පිළිබඳ විද්‍යාපති උපාධිය	පශ්චාත් උපාධි	වසර 2	ඉංග්‍රීසි
ව්‍යායාම සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය	පශ්චාත් උපාධි	වසර 1 ½	ඉංග්‍රීසි

8. 2023 වසරේ සමස්ත කාර්ය සාධනය

තිරසාර අධ්‍යාපනය, පර්යේෂණ සහ නවෝත්පාදන තුළින් ශ්‍රී ලංකාවේ ජනතාවට ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් සැපයීම පිණිස වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, පිරිනැමීම, අධීක්ෂණය සහ ඇගයීම යනුවෙන් දැක්වෙන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මෙහෙවරට අනුව එය නව වෙළෙඳපොළ අරමුණුකොටගත් තේමාත්මක උපාධි වැඩසටහන් හඳුන්වාදීමේ ක්‍රියාවලිය ආරම්භ කළේය. 2023 වර්ෂයේදී, වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය විසින් පහත දැක්වෙන නව උපාධි වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සිය අධ්‍යන කටයුතු ආරම්භ කරන ලදී.

1. ව්‍යායාම සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ විද්‍යාපති (MSc ESS) පාඨමාලාව
2. මහජන සෞඛ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති (MPH) පාඨමාලාව

මෙම වැඩසටහන් දෙක පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය විසින් පිරිනමන ලද පාඨමාලා වන අතර, එය 2023 වර්ෂයේ දී වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය වෙත ලබා දෙන ලදී. දන්ත වෛද්‍ය විද්‍යා පීඨයේ පවත්වාගෙන යනු ලබන තවත් වැඩසටහන් දෙකක් ද වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය වෙත මාරු කිරීම සඳහා අදාළ අනුමත කිරීමේ ක්‍රියාවලිය මේවනවිට සිදුවෙමින් පවතී. තවත් වැඩසටහන් තුනක් විෂයමාලා සංවර්ධන අදියරේ පවතින අතර නුදුරු අනාගතයේ එම පාඨමාලා දී පිරිනැමීමට නියමිතය.

වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය විසින් නිවර්තන වෛද්‍ය විද්‍යාව පිළිබඳ පර්යේෂණ මධ්‍යස්ථානය සමඟ එක්ව නිවර්තන වෛද්‍ය විද්‍යාව පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.

ආයතනයේ වැදගත් සිදුවීම් නිතිපතා යාවත්කාලීන කිරීම අරමුණුකොට වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය සඳහා වෙබ් අඩවියක් සකස් කරන ලදී.

සාරාංශයක් ලෙස, ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීම සඳහා වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය එහි අධ්‍යාපනික පිරිනැමීම් සහ පර්යේෂණ වැඩසටහන් පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. හවුල්කාරිත්වයන් සහ නව වැඩසටහන් හරහා වෛද්‍ය විද්‍යාව සහ මහජන සෞඛ්‍ය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කිරීම මෙමගින් අරමුණු කරයි.

9. තිරසාරභාවය මත පදනම් වූ අනාගත ප්‍රක්ෂේපන වාර්තාව

මාර්ගගත ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාකාරකම් සඳහා වන ආධාරක ව්‍යුහය ශක්තිමත් හා ප්‍රවේශ විය හැකි අයුරින් මනාව නඩත්තු කර පවත්වාගෙන යාමට වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය කැපවීමෙන් කටයුතු කරයි. මෙම ප්‍රයත්නයන් තුළ සමීක්ෂණ හරහා සිසුන්ගෙන් සක්‍රීයව ප්‍රතිපෝෂණ ලබා ගනිමින් ප්‍රමාණවත් සම්පත් සැපයීම ඇතුළත් වන අතර එමඟින් මෙම අධ්‍යාපන වැඩසටහන් අඛණ්ඩව අධීක්ෂණය කිරීමට සහ වැඩිදියුණු කිරීමට අවකාශ ලැබේ.

එපමණක් නොව, සෞඛ්‍ය හා වෛද්‍ය අංශය තුළ වර්ධනය වන අවශ්‍යතා පිළිබඳව ආයතනය දැනුවත්ව සිටී. එබැවින්, මෙම ආයතනය විසින් සිසුන්ට අදාළ සහ යාවත්කාලීන පුහුණුව ලැබීම සහතික කරමින් එය වර්තමාන ඉල්ලීම් සහ අපේක්ෂිත අනාගත ප්‍රවණතා යන දෙකම ආවරණය වන පරිදි නිර්මාණය කර ඇති කෙටි කාලීන පාඨමාලා මාලාවක් හඳුන්වා දෙනු ලැබේ.

පර්යේෂණ සහ නවෝත්පාදන සංස්කෘතියක් ස්ථාපිත කිරීමේ කාර්යයෙදී, වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය විසින් කීර්තිමත් ජාතික හා ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සහ විශ්ව විද්‍යාල සමඟ හවුල්කාරිත්වයන් ගොඩනගාගෙන කටයුතු කරයි. සහයෝගීතා පර්යේෂණ වැඩසටහන් හරහා, සිසුන් පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා සක්‍රීයව සහභාගී වීමට දිරිමත් කරනු ලබයි. ඒ හරහා සිසුන්ගේ අධ්‍යයන හා ප්‍රායෝගික කුසලතා වැඩි දියුණුවීම සිදුවන අතරම ඔවුන්ගේ ක්ෂේත්‍රවල ප්‍රගතියටද එය දායක වේ.

අනාගත සිසුන් ආකර්ෂණය කර ගැනීමේදී ආයතනය පිළිබඳ දෘශ්‍යතාවේ වැදගත්කම හඳුනා ගනිමින්, වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය විවිධ පාඨමාලා සහ පවතින අවස්ථා පිළිබඳ ප්‍රචාරණය කිරීම සඳහා තම වෙබ් අඩවිය නිතිපතා යාවත්කාලීන කිරීමට කටයුතු කරයි. ආයතනයේ මාර්ගගත අවකාශ වැඩි කිරීම මඟින්, එහි ප්‍රවේශය පුළුල් කිරීම සහ අවසානයේ සියලුම වැඩසටහන් හරහා වාර්ෂික ශිෂ්‍ය ඇතුළත් කිරීම් ඉහළ නැංවීමට ආයතනය අරමුණු කරයි.

තවද, වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය අධ්‍යයන සහ පරිපාලන ක්‍රියාවලීන්හි අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සඳහා පහසුකම් සැලසීම පිණිස එහි ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීමට කැපවීමෙන් කටයුතු කරයි. ශිෂ්‍ය ප්‍රතිපෝෂණ ලබාගැනීමෙන් සහ ඒවාට ක්‍රියාකාරීව ප්‍රතිචාර දැක්වීමෙන්, සමස්ත ඉගෙනුම් අත්දැකීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ආයතනය ප්‍රයත්න දරයි.

වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය සිය සියලු ප්‍රයත්නයන්හිදී, පරිසර ආරක්ෂණයට ප්‍රමුඛත්වය දෙමින් සහ පාරිසරික බලපෑම් අවම කරමින් තිරසාර සංවර්ධන මූලධර්මවලට දැඩි ලෙස අනුකූලව කටයුතු කරයි. දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් සහ පරිසර හිතකාමී භාවිතයන් හරහා, ආයතනය හරිත හා වඩා තිරසාර අනාගතයක් සඳහා සිය මෙහෙවරෙහි සියලුම පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීම ආයතනයේ අරමුණුයි.

10. විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව

හැඳින්වීම

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් 2022.03.12 දින පැවති එහි 3 වැනි රැස්වීමේදී විගණන හා කළමනාකරණ කමිටුව පත් කරන ලද අතර අදාළ පත්වීම් ලිපි 2022.09.22 දින නිකුත් කරන ලදී. මෙම කමිටුව යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශවල 7.4.1 ඡේදයේ දක්වා ඇති විධිවිධාන යටතේ විශ්වවිද්‍යාලයේ විධායක නොවන පාලක සභා සාමාජිකයින් දෙදෙනෙකු සහ මහා භාණ්ඩාගාරය නියෝජනය කරන සාමාජිකයෙකුගෙන් සමන්විත වේ.

2023 වර්ෂයේදී විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් (04) පවත්වන ලද අතර ඒ සඳහා අධ්‍යක්ෂ, සහකාර ලේඛකාධිකාරී, සහකාර මූල්‍යාධිකාරී (වැඩබලන) සහ ශ්‍රී ලංකාවේ විගණකාධිපතිවරයා නියෝජනය කරමින් ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී සහභාගී වූහ. විගණන සහ කළමනාකරණ කමිටුව සිය කටයුතු යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛවල දක්වා ඇති විෂය පථයට අනුකූලව ඉටු කරන අතර මුදල්, අධ්‍යයන, අනධ්‍යයන කටයුතු සඳහා අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීම සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අනධ්‍යයන ක්‍රියාකාරකම් සහ පරිපාලන ක්‍රියා පටිපාටි වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරයි.

ප්‍රගතිය

සමාලෝචිත වර්ෂය තුළ, පහත වගුවේ ඉදිරිපති කර ඇති දිනයන්හිදී (වගුව 01) පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී අභ්‍යන්තර පාලන සහ විගණන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ඉවහල්වූ නිර්දේශ, උපදෙස් සහ යෝජනා කිහිපයක් ඉදිරිපත් කර ඇත.

2023 වර්ෂය තුළ විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වන ලද දිනයන්.

රැස්වීම අංකය	රැස්වීමේ දිනය
වි.ක.ක. හි 03 වන රැස්වීම	2023.03.17
වි.ක.ක. හි 04 වන රැස්වීම	2023.06.16
වි.ක.ක. හි 05 වන රැස්වීම	2023.11.17
වි.ක.ක. හි 06 වන රැස්වීම	2023.12.22

වගුව **-01**

<u>අභ්‍යන්තර විගණන අංශය</u>

විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම්වලදී වැදගත් කරුණු සාකච්ඡාවට භාජනය කරන ලද අතර එකී කමිටු නිර්දේශ පහත සඳහන් පරිදි සාරාංශගත කළ හැකිය.

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සේවයේ නියුතු නිලධාරීන්ට බාහිර විගණකවරයා සමඟ සම්බන්ධ වී විගණකාධිපතිවරයාගේ විගණන විමසුම්වල සහ වාර්තාවල පෙන්වාදී ඇති දෝෂ සහ අඩුපාඩු පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් දෙන ලදී.
- මීට අමතරව, අභ්‍යන්තර විගණන අංශය නියැදි විගණන ශිල්පීය ක්‍රම, පාලන පරීක්ෂණ, සාරභූත විශ්ලේෂණ ක්‍රියා පටිපාටි සහ සවිස්තරාත්මක සාරභූත ක්‍රියා පටිපාටි භාවිතා කරමින් එහි වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම ආවරණය කර ඇත.

ඒ අනුව, විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම්වලදී වැදගත් කරුණු සාකච්ඡා කරන ලද අතර, එම කමිටුවේ නිර්දේශ පහත පරිදි සාරාංශගත කළ හැකිය.

- ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී අයවැය ලේඛන සහ අරමුදල් භාවිතා කිරීම පිළිබඳව සමාලෝචනය, ඇගයීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ආයතනයේ අධ්‍යයන කටයුතු ආරම්භයේ සිට ලබා ඇති ප්‍රගතිය සමාලෝචනය, ඇගයීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ අරමුණුවලට අදාළව ස්වයං මූල්‍ය පාඨමාලා පවත්වමින් අරමුදල් රැස් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අදාළවන නීති රීති අනුගමනය කිරීම.
- වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ එක් එක් උපාධි වැඩසටහන් සඳහා වෙන වෙනම මූල්‍ය වාර්තා පවත්වාගෙන යාම.
- වැඩමුළුව සඳහා පැමිණෙන භාහිර කථිකාචාර්යවරුන් සහ සම්පත් දායකයින් සඳහා නියමිත වේලාවට ගෙවීම් සිදුකිරීම.
- වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය සඳහා ගිණුම් පැකේජයක් මිල දී ගැනීම කඩිනම් කිරීම.
- වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය වෙත ස්ථිර කාර්ය මණ්ඩලය බඳවා නොගෙන පැවරුම් පදනම මත තාවකාලික කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.

විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා දැක්වූ අදහස් පහත දැක්වේ.

- ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිවල පවතින දුර්වලතා නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතින අතර අභ්‍යන්තර පාලනයන් තවදුරටත් සමාලෝචනය කිරීම, වැඩිදියුණු කිරීම සහ බලාත්මක කිරීම සිදුකිරීමට අවශ්‍ය වේ. - (2023.03.17 දින පැවැති විගණන සහ කළමනාකරණ කමිටුවෙහි 03 වන රැස්වීමේදී).

- අභ්‍යන්තර විගණන අංශය, විගණන හා කළමනාකරණ කමිටුව සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කරනු ලබන අභ්‍යන්තර පාලන ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ සහයෝගිතාව අවශ්‍ය වේ. - (2023.03.17 දින පැවැති විගණන සහ කළමනාකරණ කමිටුවෙහි 03 වන රැස්වීමේදී)

- ආයතනය පවත්වාගෙන යාම සඳහා අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම සහ එහි පැවැත්ම සඳහා අරමුදල් රැස් කිරීම. (2023 ජූනි 16 වන දින පැවැති විගණන සහ කළමනාකරණ කමිටුවෙහි 04 වන රැස්වීමේදී).

- වත්මන් ඉහළ කළමනාකාරීත්වය විගණන සහ කළමනාකරණ කමිටුවේ සහ අභ්‍යන්තර විගණන අංශයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ධනාත්මක පියවර ගෙන ඇත. – (2023.12.22 දින පැවැති විගණන සහ කළමනාකරණ කමිටුවෙහි 06 වන රැස්වීමේදී).

පසුබෑම් සහ සාධාරණීකරණය

අභ්‍යන්තර විගණන අංශය ප්‍රමාණවත් නොවන මානව සම්පත් ප්‍රතිපාදන යටතේ අනුමත අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව සිය අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර ඇත. මේවන විට අභ්‍යන්තර විගණන අංශය සිය අභ්‍යන්තර විගණන රාජකාරී පේරාදෙණිය විශ්වවිද්‍යාලයට පමණක් නොව පශ්චාත් කෘෂිකර්ම ආයතනය, විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත ද 2019 වසරේ සිට පුළුල් කර ඇත.

එමෙන්ම, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සහ එහි පශ්චාත් උපාධි ආයතනවල පවතින ක්‍රියාකාරකම් විශාල ප්‍රමාණයක් පිළිබඳව සලකා බැලීමේදී විශ්වවිද්‍යාල වාර්ෂික විගණන සැලැස්ම සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා අමතර සේවක සංඛ්‍යාව සැපයීම සාධාරණ ය. තවද, එක් එක් පශ්චාත් උපාධි ආයතනය සඳහා ඔවුන්ගේ විගණන කටයුතු බාධාවකින් තොරව සිදු කිරීම සඳහා වෙනම සේවක සංඛ්‍යාවක් ලබාදීම අවශ්‍ය වේ.

අනාගත සැලසුම්

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විගණන සහ කළමනාකරණ කමිටුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය හා පරිපාලන ක්‍රියා පටිපාටි වැඩිදියුණු කිරීම පිණිස පද්ධති සහ පාලන සමාලෝචනය සහ අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා සිය අරමුණු තවදුරටත් පුළුල් කිරීමට සැලසුම් කරයි. තවද, අභ්‍යන්තර විගණන අංශයට එහි රාජකාරී හා කාර්යයන් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා මානව සම්පත් ප්‍රතිපාදන වැඩි කරන ලෙස ඉල්ලා සිටී.

කමල් පද්මසිරි මහතා
සභාපති, විගණන සහ කළමනාකරණ කමිටුව
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

සුගත් කොඩිතුවක්කු
නියෝජ්‍ය අභ්‍යන්තර විගණක

11. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ව්‍යවස්ථාපිත වාර්තාව 2023

ව්‍යවස්ථාපිත වාර්තාව සහ වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2023 දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම.

1. සාමාන්‍ය කරුණු

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන, 2019 අංක 03 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන ආඥාපනතේ 17 (1) (අ) සහ 18 (1) වගන්ති, පසුකාලීන නීති සම්පාදනය මගින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106 (1) සහ 107 (ආ) වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතට අනුකූලව සකස් කර ඇත.

2. ගිණුම්කරණ ප්‍රතිපත්ති (ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 1)

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් (“මූල්‍ය ප්‍රකාශන”) පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූලධර්ම මත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.ගි.ප්‍ර.) / ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර.) වලට අනුකූලව - 2009 දී ප්‍රකාශයට පත් කරන ලද I වෙළුම, 2012 දී ප්‍රකාශයට පත් කරන ලද II වන වෙළුම සහ 2018 දී ප්‍රකාශයට පත් කරන ලද III වෙළුම අනුව සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ 1971 අංක 38 දරන මුදල් පනත සහ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තු විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව උපචිත පදනම මත සකස් කරන ලද පොදු කාර්ය මූල්‍ය වාර්තාවකි. මෙම මූල්‍ය ප්‍රකාශනයට බලපාන උද්ධමන සාධක සඳහා ගැලපීම් සිදු කර නොමැත.

3. දේපල, පිරියත සහ උපකරණ (ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 7)

දේපල, පිරියත සහ උපකරණ (PPE) මිල දී ගැනීමේ පිරිවැය සහ ඒ සඳහා දරන ලද අමතර පිරිවැය සමග දැක්වේ. ක්ෂයවීම් සංකල්පය අංක 649 හා 1995 ඔක්තෝම්බර් 5 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව අනුගමනය කරන ලද අතර සරල මාර්ග ක්‍රමය අනුව ප්‍රකාශයේ සටහන් කරන ලදී. දේපල, පිරියත සහ උපකරණ පිරිවැය ක්‍රමය මත පවත්වාගෙන යනු ලැබේ.

ක්ෂයවීම් පහත සඳහන් ප්‍රතිශතවලින් වාර්ෂිකව ගණනය කරනු ලැබේ

ගොඩනැගිලි සහ ව්‍යුහ	05%
කාර්යාල උපකරණ	20%
රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ	20%
ගෘහ භාණ්ඩ සහ උපාංග	10%
පරිගණක උපකරණ සහ උපාංග	20%

3.1 ඉඩම

ආයතනයේ ගොඩනැගිල්ල ඉදිකර ඇති ඉඩමේ අයිතිය පේරාදෙණිය විශ්වවිද්‍යාලය සතුවේ. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ. එබැවින් ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ඉඩමේ වටිනාකම නොසලකාහැර ඇත. නමුත් එම ඉඩමේ වටිනාකම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ගිණුම්වල දක්වා ඇත.

3.2 ගොඩනැගිල්ල

කාර්යාල හා දේශන කාමර පිහිටි ගොඩනැගිලි පරිශ්‍රය පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් ඉදිකර ඇත. එහෙයින් ආයතනයේ ගිණුම් පොත්වල ගොඩනැගිලි සඳහා වන පිරිවැය ගිණුම්ගත කර නොමැති අතර ගොඩනැගිලි වටිනාකම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ගිණුම් පොත්වල සටහන් කර ඇත.

4. ජංගම වත්කම්

මූල්‍ය තත්ත්ව ප්‍රකිශයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් යනු සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ හෝ වාර්තා කළ දින සිට වසරක් ඇතුළත යන කාල පරිච්ඡේයන් අතරින් කලින් එළැඹී කාල පරිච්ඡේදය තුළ උපලබ්ධි වේයැයි බලාපොරොත්තු වන මුදල් සහ මුදල් සමාන දෑ වේ.

4.1. ගබඩාභාණ්ඩ / තොග

ගබඩාභාණ්ඩ / තොග පිරිවැය පදනම මත අගය කෙරේ. ගබඩාභාණ්ඩ /තොගවල පිරිවැය පළමු ගැණුම්, පළමු නිකුතු පදනම (FIFO) භාවිතයෙන් පවත්වාගෙන යනු ලැබේ. ප්‍රකාශවල දැක්වෙන ගබඩාභාණ්ඩ / තොග ශේෂය 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා භෞතිකව සත්‍යාපනය කර ඇත.

4.2 මුදල් සහ මුදල් සමානදෑ

මුදල් සහ මුදල් සමාන මුදල් 2023 දෙසැම්බර් 31 වන දිනට මහජන බැංකුවේ සහ ලංකා බැංකුවේ ජංගම ගිණුම්වල ශේෂයන්ගෙන් සමන්විත වේ.

5. මුදල් ප්‍රවාහ ප්‍රකාශය (SLPSAS 2)

ආයතනයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය යටතේ සකස් කර ඇත.

6. වගකීම් සහ ප්‍රතිපාදන

- මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වර්ගීකරණය කර ඇති ජංගම වගකීම් යනු ඉල්ලුම මත හෝ වාර්තා කළ දින සිට වසරක් ඇතුළත ගෙවීමට නියමිත වගකීම් වේ.

- ජංගම නොවන වගකීම් යනු වාර්තා කළ දින සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂයන් වේ.

- වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත.

7. විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

ආයතනයේ සේවකයින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අනුව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් දායකත්වය සඳහා සහ 1980 අංක 46 දරන සේවක භාර අරමුදල් පනතට අනුව සේවක භාරකාර අරමුදල දායක මුදල් සඳහා සුදුසුකම් ලබයි. බාහිරව ක්‍රියාත්මක වන අනුමත සේවක අර්ථසාධක අරමුදලකට (7%), සේවක විශ්‍රාම වැටුප් අරමුදලට (8%) සහ සේවක භාරකාර අරමුදලට (3%) ක් වශයෙන් විශ්වවිද්‍යාලය විසින් සේවක දළ වැටුපෙන් 15% සහ 3% ක නිශ්චිත ප්‍රතිශතයන් දායක වේ.

8. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශ (SLPSAS 1)

8.1 අධ්‍යාපන සේවාව පවත්වාගෙන යාමට සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂමව පවත්වාගෙන යාමට දරන ලද සියලුම වියදම් වර්ෂය සඳහා අතිරික්තය ගණනය කිරීමේදී ආදායමට අයකර ඇත.

8.2 අධ්‍යාපන සේවයේ ඉපැයීම් ධාරිතාව ඉහළ නැංවීමේ අරමුණින් කටයුතු පවත්වාගෙන යාම සඳහා ස්ථීර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැලකේ.

9. අසම්භාව්‍ය වත්කම් සහ වගකීම් (SLPSAS 8)

ආයතනය විසින් 2023.12.31 දිනට කිසිදු අවිනිශ්චිත වත්කමක් හෝ වගකීමක් හඳුනාගෙන නොමැත.

10. මූල්‍ය සුවිශේෂීතා

10.1 රජයේ ප්‍රදාන (ශ්‍රී.ලං.ගි.ප්‍ර.20)

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය/විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රදාන රජයේ ප්‍රදාන ලෙස හඳුනාගැනේ. ආදායම් ක්‍රමයට අදාළ ප්‍රදාන ඉදිරිපත් කිරීම ආයතනය තුළ රජයේ ප්‍රදානය යටතේ පවත්වාගෙන යනු ලැබේ. 2023 වසරේදී ලද රජයේ ප්‍රදාන පිළිබඳ විස්තර පහත පරිදි වේ.

මුළු පුනරාවර්තන ප්‍රදාන : රු. 8,000,000.00
මුළු ප්‍රාග්ධන ප්‍රදාන : රු. 0.00

විස්තරය	2023		
	වෙන් කළ මුදල (රු.)	නිකුත් කළ මුදල (රු.)	නිකුත් නොකළ මුදල (රු.)
පුනරාවර්තන ප්‍රදාන (පුද්ගල පඩිනඩි සහ අනෙකුත් පුනරාවර්තන)	13,000,000.00	8,000,000.00	5,000,000.00
ප්‍රාග්ධන දීමනාව (වත්කම් අත්පත් කර ගැනීම)	-	-	-

10.2 මෙහෙයුම් අතිරික්තය/ (හිඟය)

2023 වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු. 10,516,059.09ක් වන අතර මූල්‍ය නොවන ගනුදෙනු ගැලපීමෙන් පසු ආයතනයේ ශුද්ධ මෙහෙයුම් ප්‍රතිඵලය පහත පරිදි වේ.

විස්තරය	**2023 (රු.)**
ශුද්ධ හිඟය/අතිරික්තය	10,516,059.09
එකතුකළා: මූල්‍ය නොවන ගණුදෙනු	364,013.40
මූල්‍ය නොවන ගණුදෙනු ගැළපීමෙන් පසු ශුද්ධ අතිරික්තය	**10,152,045.69**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	*සටහන*	***2023***	***2022***
		රු.	***රු.***
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් සමාන දෑ	01	7,355,347.67	1,888,707.48
නොපියවූ අත්තිකාරම්		-	42,000.00
ලැබිය යුතු - පාඨමාලා ගාස්තු		12,660,000	
අතැතිතොග		35,397	
		20,050,745	**1,930,707.48**
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	02	2,505,844.52	1,412,136.70
		2,505,844.52	**1,412,136.70**
මුළු වත්කම්		**22,556,589.14**	**3,342,844.18**
වගකීම්			
ජංගම වගකීම්			
පාරිතෝෂිකය ප්‍රතිපාදන		6,380,933	140,665.62
ගෙවිය යුතු විගණන ගාස්තු		200,000	100,000.00
ගෙවිය යුතු මුදල්	03	3,531,116	2,343,828.00
උපචිත වියදම්	04	1,259,142.63	235,987.14
		11,371,191.63	**2,820,480.76**
මුළු වගකීම්		**11,371,191.63**	**2,820,480.76**
මුළු ශුද්ධ වත්කම්		**11,185,397.51**	**522,363.42**
ශුද්ධ වත්කම් / හිමිකම්			
සමුච්චිත අතිරික්තය		11,185,397.51	522,363.42
		11,185,397.51	522,363.42
මුළු ශුද්ධ වත්කම් / හිමිකම්		**11,185,397.51**	**522,363.42**

මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරණ මුදල් පනතේ අවශ්‍යතා සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන බව මම මෙයින් සහතික කරමි.

නියෝජ්‍ය මුල්‍යාධිකාරි

කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් විසින් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම දරනු ලැබේ. කළමනාකරණ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

අධ්‍යක්ෂ/ ගිණුම් නිලධාරී

මහාචාර්ය ඒ. එම්. ආටිගල
කළමනාකරණ මණ්ඩල සාමාජික

මහාචාර්ය වසන්ති පින්ටෝ
කළමනාකරණ මණ්ඩල සාමාජික

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

2023 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වූ වසර	*සටහන*	***2023 වර්ෂය***	***2022 වර්ෂය***
		රු.	***රු.***
මෙහෙයුම් ආදායම			
ආදායම	05	22,922,500	-
පුනරාවර්තන ප්‍රදාන		8,000,000	8,980,000.00
		30,922,500.00	**8,980,000.00**
මෙහෙයුම් වියදම්			
පුද්ගල පඩිනඩි	06	18,424,793	7,657,697.50
ගමන් වියදම්	07	35,774	312.00
සැපයුම් සහ පාරිභෝජ්‍ය	08	168,892	88,382.69
කොන්ත්‍රාත් සේවා	09	853,645	110,509.09
ක්ෂයවීම් දීමනාව	10	364,013	75,541.30
වෙනත් පුනරාවර්තන වියදම්	11	559,324	524,969.00
මුළු මෙහෙයුම් වියදම්		**20,406,440.91**	**8,457,636.58**
කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ (හිඟය).		**10,516,059.09**	**522,363.42**

හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

2023 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	**ප්‍රාග්ධන අරමුදල් රු.**	**සමුච්චිත අරමුදල රු.**	**හිමිකම්වල වෙනත් සංරචක රු.**	**එකතුව රු.**
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය (වාර්තා කරන ලද)		**522,363.42**		**522,363.42**
අධි / ඌණ ප්‍රතිපාදන	-	146,975.00	-	- -
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	-	669,338.42	-	**522,363.42**
අරමුදල්වල ශුද්ධ සංචලනය	-		-	-
කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/(හිඟය).	-	10,516,059..09		10,469,839.58
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**11,185,397.51**	**-**	**11,185,397.51**

සටහන

2022 වර්ෂයට අදාළව අධිතක්සේරු කරන ලද උපචිත වියදම් රුපියල් 146,975.00ක් සමුච්චිත අරමුදල්වලට ගලපා ඇත.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් **31** න් අවසන් වූ වසර සඳහා	*2023*	*2022*
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහය	**රු.**	**රු.**
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් අතිරික්තය / (හිඟය)	10,516,059	522,363.42
මූල්‍ය නොවන සංචලනය	**10,516,059**	**522,363.42**
ක්ෂය වැඩි වීම	364,013	75,541.30
ප්‍රතිපාදන වැඩි වීම	146,975	
කාරක ප්‍රාග්ධනය වැඩිවීම/අඩුවීම	**510,988**	**75,541.30**
තොග වැඩි වීම	(35,397)	-
ගෙවිය යුතු මුදල් වැඩි වීම	1,187,288	343,828.00
පාරිතෝෂික ප්‍රතිපාදන වැඩි වීම	6,240,267	140,665.62
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන වැඩි වීම	100,000	100,000.00
උපචිත වියදම්/ප්‍රතිපාදන වැඩි වීම	1,023,155	235,987.14
ලැබිය යුතු පාඨමාලා ගාස්තු වැඩි කිරීම	(12,660,000)	-
ණය සහ අත්තිකාරම් වැඩි වීම	42,000	(42,000.00)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	**(4,102,686.08)**	**778,480.76**
ආයෝජන කටයුතු වලින් ජනිත මුදල් ප්‍රවාහය		
දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම	(1,457,721)	(1,487,678.00)
ආයෝජන කටයුතු වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	**(1,457,721.22)**	**(1,487,678.00)**
මූල්‍ය කටයුතු වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය		-
විශ්වවිද්‍යාලයේ ණය	-	2,000,000.00
මූල්‍ය කටයුතු වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	-	**2,000,000.00**
මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	**5,466,640.19**	**1,888,707.48**
කාල පරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	1,888,707.48	-
කාල පරිච්ඡේදය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	**7,355,347.67**	**1,888,707.48**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ හෙළිදරව් කිරීම්

ආයතනික මූල්‍ය තොරතුරු

1.1 ආයතනික තොරතුරු

1.1.1 වාර්තාකරණ අස්ථිත්වය

ශ්‍රී ලංකාවේ, මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගැටඹේ, පේරාදෙණියේ පිහිටි වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, 2019 සැප්තැම්බර් 9 වැනි දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24A වගන්තිය සමඟ කියවියයුතු 18 වැනි වගන්තිය යටතේ සාදන ලද ආඥාපනතකට අනුව පිහිටුවන ලද පූර්ණ වශයෙන් රජයට අයත් උසස් අධ්‍යාපන ආයතනයකි. මෙම ආඥාපනත 2019 අංක 03 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයත ආඥාපනත ලෙස හඳුන්වනු ලැබේ. මෙම ආයතනයේ මූල්‍ය මෙහෙයුම් 2022 පෙබරවාරි මස ආරම්භ විය.

1.1.2 නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දුන් දිනය

ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් 2022 ජනවාරි 13 වැනි දින පැවති එහි පළමු රැස්වීමේදී විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අවසර දෙන ලදී.

1.1.3 වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය කාලපරිච්ඡේදය 2023 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා වේ.

1.1.4 මූල්‍ය ප්‍රකාශන

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන 2033 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, අයවැය හා සත්‍ය මුදල සංසන්දනය කිරීම් ප්‍රකාශය සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන් ඇතුළත් වේ.

1.2 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

1.2.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (ශ්‍රී ලං. රා.ගි.ප්‍ර.) අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, සාධාරණ ඉදිරිපත් කිරීම සහතික කිරීම සඳහා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් නොමැති අවස්ථාවලදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං. ගි.ප්‍ර.) ඒ සඳහා යොදාගෙන ඇත.

1.2.2 මිණුම්කරණ පදනම

සාධාරණ වටිනාකමට මනිනු ලබන දේපල, පිරියත සහ උපකරණ හැර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය මත පදනම්ව පිළියෙළ කර ඇත.

1.2.3 කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ මුදල්

විශ්වවිද්‍යාලය විසින් භාවිතා කරනු ලබන සහ ඉදිරිපත් කරනු ලබන ව්‍යවහාර මුදල්වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

1.2.4 වැදගත්භාවය සහ සමූහනය

සමාන අයිතමවල සෑම වැදගත් පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කර ඇත. වැදගත් නොවන්නේ නම් මිස, අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරීත්වයක් ඇති අයිතම වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන බොහෝ ගනුදෙනු හෝ වෙනත් සිදුවීම් ඒවායේ ස්වභාවය හෝ ක්‍රියාකාරීත්වය අනුව පන්තිවලට එකතු කර සැකසීමේ ප්‍රතිඵලයකි.

1.2.5 අඛණ්ඩ පැවැත්ම

කළමනාකරණ මණ්ඩලය විසින් ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව තක්සේරු කර ඇති අතර, අපේක්ෂා කළ හැකි අනාගත කාලයක් සඳහා ආයතනයට ක්‍රියාත්මකව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් තරම් සම්පත් පවතින බවට ඔවුන් තුළ සාධාරණ අපේක්ෂාවක් ඇත. අනාගතය පිළිබඳ පවතින සියලු තොරතුරු සැලකිල්ලට ගනිමින් ආයතනය ඇවර කිරීමේ හෝ මෙහෙයුම් නතර කිරීමේ අවශ්‍යතාවයක් ඇතැයි කළමනාකරණ මණ්ඩලය අපේක්ෂා නොකරයි. එබැවින්, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ආයතනය අඛණ්ඩව පැවැත්ම පිළිබඳ පදනම අනුගමනය කරයි.

1.2.6 ජංගම සහ ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීම

ආයතනය විසින් ශ්‍රී.ප්‍ර.ගි.රා.ලං. අනුව ජංගම/ජංගම නොවන වර්ගීකරණය මත පදනම්ව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් සහ වගකීම් ඉදිරිපත් කරයි.

1.3 අනුගමනය කරනලද වැදගත් මිණුම්කරණ ප්‍රමිති

1.3.1 ශ්‍රී.ප්‍ර.ගි.රා.ලං. අනුගමනය කිරීම

2023 වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී ආයතනය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර ඇත.

1.3.2 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් මූල්‍ය වර්ෂය අවසානයේ දී ආදායම, වියදම්, වත්කම්, වගකීම්, සහ අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීමට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම අවශ්‍ය වේ.

1.3.3 ආදායම් හඳුනාගැනීම

පුනරාවර්තන වියදම් දැරීම සඳහා රජයේ ප්‍රදානය උපචිත පදනම මත ලැබෙන විට හඳුනාගෙන ඇත.

1.3.4 රජයේ ප්‍රදාන

ශ්‍රී.ප්‍ර.ගි.රා.ලං. 01 හි විධිවිධානවලට අනුකූලව, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ආයතනයට ලැබුණු විට පමණක් හඳුනාගනු ලැබේ. වර්ෂය සඳහා ලැබුණු පුනරාවර්තන ප්‍රදානය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ආදායම ලෙස හඳුනාගෙන ඇත.

1.3.5 දේපල, පිරියත සහ උපකරණ

1.3.5.1 හඳුනාගැනීමේ පදනම

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමට හැකියාව පවතී නම් සහ වත්කම්වල පිරිවැය විශ්වසනීයව මිනුම් කළ හැකි නම් දේපල, පිරියත සහ උපකරණ හඳුනාගනු ලැබේ.

1.3.5.2 මිණුම්කිරීමේ පදනම

වත්කමක් ලෙස හඳුනාගැනීමට සුදුසුකම් ලබන දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් මූලිකව එහි පිරිවැයට මනිනු ලැබේ. වත්කම් අත්පත් කර ගැනීමට සෘජුවම දරන ලද වියදම් සහ ඒ වෙනුවෙන් පසුකාලීනව දරන ලද වියදම් පිරිවැයට ඇතුළත් වේ.

1.3.5.3 දේපල, පිරියත සහ උපකරණ ක්ෂය වීම

ආයතනය විසින් පහත සඳහන් අනුපාතවලට අනුව ක්ෂය ප්‍රතිපාදනය කරන ඉඩම් හැර දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් සරල මාර්ග පදනම මත වන ක්ෂය ක්‍රමවේදය අනුගමනය කරනු ලබන අතර අංක 649 සහ 09/2022 දරන වි.වි.ප්‍ර.කොෂ. චක්‍රලේඛය මත පදනම්ව ක්ෂයවීම් වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනා ගනී.

වත්කම් පන්තිය	%
ගොඩනැගිලි	5%
පිරියත, යන්ත්‍රෝපකරණ සහ මෙවලම්	10%
මෝටර් රථ	20%
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	10%
කාර්යාලය සහ වෙනත් උපකරණ	20%
පරිගණක උපකරණ සහ උපාංග	20%
පුස්තකාල පොත් සහ වාර ප්‍රකාශන	20%
උපාධි කබා	20%

කිසියම් වත්කමක් භාවිතයට සඳහා තබා ඇති අවස්ථාවේ සිට එහි ක්ෂය වීම ආරම්භ වන අතර ස්වයං-සාදිත වත්කම් සම්බන්ධයෙන් වන කල්හි වත්කම සම්පූර්ණ කර භාවිතයට සූදානම් කහ දිනයේ සිට ක්ෂය වීම ආරම්භ වේ. වත්කම විකිණීමට තබා ඇති ලෙස වර්ගීකරණය කළ දිනය සහ වත්කම හඳුනා නොගන්නා දිනය යන දින අතරින් කලින් එළැඹි දිනයේදී ක්ෂය වීම් නතර වේ.

1.4 මුදල් සහ මුදල් සමාන දෑ

1.4.1 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ යන්නට අතැති මුදල් සහ ජංගම ගිණුම්වල ශේෂව පවත්නා මුදල් ඇතුළත් වේ. තවද, මුදල් හා සමාන මුදල් පිළිබඳ විස්තර ගිණුම් ප්‍රකාශයේ සටහන් අංක: 1 හි සඳහන් කර ඇත.

1.4.2 වියදම් හඳුනා ගැනීම

දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතමයක ඉපැයීම අතර පවතින සෘජු සම්බන්ධතාවයක පදනම මත මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වියදම් හඳුනාගෙන ඇත. ආයතනය පවත්වාගෙන යාමේදී සහ දේපළ කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇත්ළත් කර ඇත.

1.5 බැරකම් සහ ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ආයතනයට පවතින වර්තමාන බැඳීමක් නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය කරන විට සහ බැඳීම් ප්‍රමාණය පිළිබඳ විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි විට ප්‍රතිපාදන හඳුනා ගනී. ප්‍රතිපාදන උපචිත වියදම් යටතේ දක්වා ඇත. විශ්වවිද්‍යාලය ඇස්තමේන්තුවකට පැමිණෙන්නේ බොහෝදුරට සිදුවීමට ඉඩ ඇති ප්‍රතිඵලය පිළිබඳ ඇගයීමක පදනම මතය. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා ප්‍රතිපාදන සියල්ල ගිණුම්ගත කර ඇත.

1.6 අයවැය ඉදිරිපත් කිරීම

ආයතනයේ අයවැය ගිණුම්කරණයේ උපචිත පදනම මත සකස් කරනු ලබයි. අයවැයේදී වියදම්වල ස්වභාවය වර්ගීකරණ පදනම ලෙස අනුගමනය කරනු ලබන අතර ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ද අනුගමනය කරන ලබනුයේ එම ක්‍රමවේදයයි. මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව ආයතනය විසින් ආදායම් සහ වියදම් වර්ගීකරණය කරනු ලැබේ. අයවැය සහ මූල්‍ය ප්‍රකාශන සකස් කරනුයේ ගිණුම්කරණයේ උපචිත පදනම මත වන බැවින්, අයවැය සහ තත්‍ය ප්‍රමාණයන් සංසන්ධනය කිරීමේ අවශ්‍යතාවය පැන නොනගී. අයවැය මගින් 2023 ජනවාරි 01 දෙසැම්බර් 31 දින සිට මූල්‍ය කාලපරිච්ඡේදය ආවරණයවේ.

දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	*2023 වර්ෂය*	*2022 වර්ෂය*
	රු.	*රු.*
01. මුදල් සහ මුදල් සමාන දෑ		
මහජන බැංකුවේ ගි/අංක අංක 057-1-001-2-0046313	47,196.89	1,041,307.48
ලංකා බැංකු ගි/අංක:0088478535	45,750.78	847,400.00
මුදල් පොත 057100100046314	7,262,400.00	-
එකතුව	**7,355,347.67**	**1,888,707.48**

දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	**2023**	**2023**	**2023**	**2023**	**2023**
	රු.	*රු.*	*රු.*	*රු.*	*රු.*

02 දේපල, පිරියත සහ උපකරණ

	ගොඩනැගිලි	ගෘහ භාණ්ඩ සහ සවිකෘත	කාර්යාල උපකරණ	පරිගණක උපකරණ / උපාංග	එකතුව
පිරිවැය					
2023 ජනවාරි 1 වන දිනට	-	1,487,678.00	-	1,487,678.00	
අඩු කළා/එකතු කළා: එකතු කිරීම්	-	359,911.22	8,450.00	1,089,360.00	1,457,721.22
බැහැර කිරීම / මාරු කිරීම	-	-	-	-	-
2023 දෙසැම්බර් 31 වැනි දිනට පිරිවැය	-	359,911.22	1,496,128.00	1,089,360.00	2,945,399.22
අඩු කළා: ක්ෂය වීම්					
2023 ජනවාරි 1 වන දිනට සමුච්චිත ක්ෂය	-	-	75,541.30	-	75,541.30
බැහැර කිරීම / මාරු කිරීම	-	-	-	-	-
ආදායම් සහ වියදම් ගිණුමට අය කිරීම්	-	7,255.44	69,714.78	287,043.18	364,013.40
2023 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂයවීම්	-	7,255.44	145,256.08	287,043.18	439,554.70
2023 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් වටිනාකම	-	**352,655.78**	**1,350,871.92**	**802,316.82**	**2,505,844.52**

දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා		*2023 වර්ෂය* රු.	*2022 වර්ෂය* රු.
03 **ගෙවිය යුතු**			
පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු		3,531,116.00	2,000,000.00
ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගම		-	343,828.00
	එකතුව	**3,531,116.00**	**2,343,828.00**
04 **උපචිත වියදම්**			
විදුලි සන්දේශ වියදම්		5,000.00	48,969.51
වැටුප් සහ වේතන - 2022 දෙසැම්බර්		-	18,329.84
ජීවන වියදම් දීමනාව		-	4,277.42
විශේෂ දීමනාව		-	3,665.97
රුපියල් 5000ක මාසික දීමනාව		-	2,741.94
මාසික හිලව් දීමනාව		-	8,248.43
විශේෂ සේවා සහාව සහ කමිටුව		-	144,000.00
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල 15%		-	4,628.36
සේවානියුක්තයන්ගේ භාර අරමුදල 3%		-	925.67
ගෙවිය යුතු මුද්දර ගාස්තු		1,000.00	200.00
ආරක්ෂක ගෙවීම		552,092.63	-
අතිකාල දීමනා		30,000.00	-
වෙනත් සැපයුම්		13,000.00	-
සහභාගීත්ව දීමනාව		150,000.00	-
භාහිර දේශන ගාස්තු		495,000.00	-
සංග්‍රහ		13,050.00	-
	එකතුව	**1,259,142.63**	**235,987.14**

	දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	සටහන	2023 වර්ෂය රු.	2022 වර්ෂය රු.
05	**ආදායම**			
	ලියාපදිංචි ගාස්තුව		1,000,000.00	-
	එම්.එස්.සී ආදායම		12,600,000.00	-
	එම්.පී.එච්. පාඨමාලා ගාස්තුව		9,000,000.00	-
	වැඩමුළු ආදායම		322,500.00	-
	වෙනත් ආදායම්		-	-
			22,922,500.00	
06	**පුද්ගල පඩිනඩි**			
	වැටුප් සහ වේතන		3,206,410.19	1,810,789.03
	විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල 15%		868,331.23	656,347.37
	සේවානියුක්තයන්ගේ භාර අරමුදල 3%		181,991.78	131,269.47
	දුරකථන දීමනාව		51,250.00	-
	අධ්‍යයන දීමනාව		2,688,348.19	2,419,509.19
	පර්යේෂණ දීමනාව		580,815.97	522,733.47
	ජීවන වියදම් දීමනාව		335,400.00	136,877.42
	අතිකාල දීමනාව		225,598.16	3,193.50
	ගෞරව ගෙවීම		348,979.95	511,751.25
	රුපියල් 5000ක මාසික දීමනාව		215,000.00	87,741.94
	මාසික හිලව් දීමනාව		352,080.00	306,953.27
	විශේෂ දීමනාව		488,374.84	3,665.97
	වාහන දීමනාව		600,000.00	550,000.00
	ඉන්ධන දීමනාව		607,960.00	376,200.00
	පාරිතෝෂික ගෙවීම		6,240,267.38	140,665.62
	අග්‍රහාර		3,600.00	-
	විනෝදාස්වාද දීමනාව		459,135.09	-
	භාහිර දේශන ගාස්තු		971,250.00	-
		එකතුව	**18,424,792.78**	**7,657,697.50**
07	**ගමන් වියදම්**			
	ගමන් වියදම් (දේශීය)		35,774.00	312.00
		එකතුව	**35,774.00**	**312.00**
08	**සැපයුම්**			
	ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා		130,204.10	56,175.69
	වෙනත්		38,688.05	32,207.00
		එකතුව	**168,892.15**	**88,382.69**
09	**ගිවිසුම්ගත සේවා**			
	ප්‍රවාහන		-	-
	පිරිසිදු කිරීමේ සේවාව		-	-
	තැපැල් සහ විදුලි සංදේශ		72,870.36	107,879.09
	මුද්‍රණ ප්‍රචාරණය		228,682.00	2,630.00
	ආරක්ෂක සේවය		552,092.63	
		එකතුව	**853,644.99**	**110,509.09**
10	**ස්ථාවර වත්කම් ක්ෂය වීම**			
	කාර්යාල උපකරණ		364,013.40	75,541.30
		එකතුව	**364,013.40**	**75,541.30**

දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා		*2023*		
		අයවැය ගත රු.	*තත්‍ය රු.*	*වෙනස්කම් රු.*
11.	**<u>අභ්‍යන්තර ආදායම්</u>**			
	වෙනත් පොලී ආදායම්	-	-	-
	ආයෝජන වලින් ලද පොලී	100,000.00	-	100,000.00
	ලියාපදිංචි ගාස්තුව	1,000,000.00	1,000,000.00	-
	උපකාරක පංති ගාස්තු	31,000,000.00	21,600,000.00	9,400,000.00
	විභාග ගාස්තු	2,000,000.00	-	2,000,000.00
	එකතුව	**34,100,000.00**	**22,600,000.00**	**11,500,000.00**
12.	**<u>පුද්ගල පඩිනඩි</u>**			
	වැටුප් සහ වේතන	4,839,000.00	3,206,410.19	1,632,589.81
	විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල 15%	1,047,000.00	868,331.23	178,668.77
	විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප	208,000.00	43,458.98	164,541.02
	සේවානියුක්තයන්ගේ භාර අරමුදල 3%	209,000.00	181,991.78	27,008.22
	අධ්‍යයන දීමනාව	2,648,000.00	2,688,348.19	(40,348.19)
	පර්යේෂණ දීමනාව	572,000.00	580,815.97	(8,815.97)
	භාහිර දේශන ගාස්තු	13,000,000.00	971,250.00	12,028,750.00
	ජීවන වියදම් දීමනාව	561,000.00	335,400.00	225,600.00
	රුපියල් 5000ක මාසික දීමනාව	360,000.00	215,000.00	145,000.00
	අතිකාල දීමනාව	516,000.00	225,598.16	290,401.84
	නිවාඩු ගෙවීම	-	-	-
	ගෞරව ගෙවීම	300,000.00	348,979.95	(48,979.95)
	ගැලපුම් දීමනා	-	-	-
	20%ක අමතර දීමනාව	521,000.00	488,374.84	32,625.16
	විනෝදාස්වාද දීමනාව	159,000.00	459,135.09	(300,135.09)
	මාසික හිලව් දීමනාව	1,172,000.00	352,080.00	819,920.00
	පාරිතෝෂිතය	-	6,240,267.38	(6,240,267.38)
	වාහන දීමනාව	600,000.00	600,000.00	-
	සන්නිවේදන දීමනාව	50,000.00	51,250.00	(1,250.00)
	ඉන්ධන දීමනාව	294,000.00	607,960.00	(313,960.00)
	එකතුව	**27,056,000.00**	**18,464,651.76**	**8,591,348.24**
13.	**<u>ගමන් වියදම්</u>**			
	ගමන් වියදම් (දේශීය)	150,000.00	35,774.00	114,226.00
	එකතුව	**150,000.00**	**35,774.00**	**114,226.00**
14.	**<u>සැපයුම්</u>**			
	ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	2,750,000.00	130,204.10	2,619,795.90
	ඉන්දන සහ ලිහිසිද්‍රව්‍ය	200,000.00	-	200,000.00
	මැහුම් ගාස්තු ඇතුළු නිල ඇඳුම්	25,000.00	-	25,000.00
	යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ	50,000.00	-	50,000.00
	වෙනත්	50,000.00	38,688.05	11,311.95
	එකතුව	**3,075,000.00**	**168,892.15**	**2,906,107.85**
15.	**<u>නඩත්තු</u>**			
	වාහන			-
	පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	-	-	-
	ගොඩනැගිලි සහ වියුහය	50,000.00	-	50,000.00
	ගෘහ භාණ්ඩ	-	-	-
	එකතුව	**50,000.00**	**-**	**50,000.00**

16.	**<u>ගිවිසුම්ගත සේවා</u>**			
	ප්‍රවාහන	300,000.00	-	300,000.00
	කුලී සහ කුලීපිට ගැනුම්	-	-	-
	ආරක්ෂක සේවා	1,400,000.00	552,092.63	847,907.37
	ජල ගාස්තු	79,000.00	-	79,000.00
	විදුලි ගාස්තු	50,000.00		50,000.00
	පිරිසිදු කිරීමේ සේවාව	1,200,000.00	-	1,200,000.00
	තැපැල් ගාස්තු	50,000.00	72,870.36	(22,870.36)
	විදුලි සංදේශ	500,000.00	-	500,000.00
	මුද්‍රණ ප්‍රචාරණය	1,500,000.00	228,682.00	1,271,318.00
	වෙනත්			-
	එකතුව	**5,079,000.00**	**853,644.99**	**4,225,355.01**
17.	**<u>වෙනත් පුනරාවර්තන වියදම්</u>**			
	විශේෂ සේවා - සභා සහ කමිටු	750,000.00	414,000.00	336,000.00
	සිසුන් සඳහා පාඨමාලා ද්‍රව්‍ය	-	-	-
	විශේෂ සේවා - වෘත්තීය සහ අනෙකුත් ගාස්තු	550,000.00	-	550,000.00
	ශිෂ්‍ය සංවර්ධන කටයුතු සහ ප්‍රජා සබඳතා	-	-	-
	ශිෂ්‍ය සුභසාධනය සහ ශිෂ්‍ය සභා සහ සමාජ සංහිදියාව	-	-	-
	සේවක සුභසාධන සහ වෛද්‍යාධාර	100,000.00	-	100,000.00
	ආයතනික සැලසුම්කරණය, පාලනය සහ බාහිර පර්යේෂණ	200,000.00	-	200,000.00
	විනෝදාස්වාද වියදම්	600,000.00	43,857.50	556,142.50
	සම්මාන සහ වන්දි	-		-
	බැංකු ගාස්තු	40,000.00	1,466.09	38,533.91
	විභාග ගාස්තු	2,000,000.00	-	2,000,000.00
	වැඩමුළු සහ සම්මන්ත්‍රණ	150,000.00	-	150,000.00
	වෙනත් පුනරාවර්තන වියදම්	-	-	-
	ශාස්ත්‍රීය පර්යේෂණ සහ ප්‍රකාශනය	100,000.00	-	100,000.00
	කාර්ය මණ්ඩල සංවර්ධනය	500,000.00	-	500,000.00
	වෙනත් සංවිධාන සඳහා ප්‍රදාන	300,000.00	-	300,000.00
	විගණන ගාස්තුව	-	100,000.00	(100,000.00)
	නිවාඩු අවසරපත්‍ර සහ වාර ප්‍රවේශපත්‍ර	50,000.00	-	50,000.00
	සම්මාන සහ වන්දි	100,000.00	-	100,000.00
	උපාධි ප්‍රදානෝත්සව	500,000.00	-	500,000.00
	වෙනත්	750,000.00	-	750,000.00
	එකතුව	**6,690,000.00**	**559,323.59**	**6,130,676.41**

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ශේෂ පත්‍රය

	2023 දෙසැම්බර් 31 දිනට		
	විස්තරය	හර	බැර
1	කාර්යාල උපකරණ	2,945,399.22	-
2	අතැති තොග	35,396.95	-
3	මුදල් පොත 057100100046314	7,262,400.00	-
4	මුදල් පොත් ශේෂය ගි/අ. 0088478535	45,750.78	-
5	මුදල් පොත් ශේෂය ගි/අ. 057-1-001-2-0046313	47,196.89	-
6	ගෙවිය යුතු - පේරාදෙණිය විශ්වවිද්‍යාලය	-	2,000,000.00
7	ලැබිය යුතු - පාඨමාලා ගාස්තු	12,660,000.00	-
8	පාරිතෝෂික ගි/අ.	6,240,267.38	-
9	S. S. වෘත්තිය සහ වෙනත් කටයුතු සඳහා ප්‍රතිපාදන (විගණන ගාස්තු) ගි/අ.	-	200,000.00
10	උපචිත වියදම්	-	2,936,233.63
11	වැටුප් සහ වේතන	3,206,410.19	-
12	පර්යේෂණ දීමනාව (අධ්‍යයන) ගි/අ.	580,815.97	-
13	ජීවන වියදම් දීමනාව ගි/අ.	335,400.00	-
14	විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	824,872.25	-
15	විශ්‍රාම වැටුප්	43,458.98	-
16	දුරකථන දීමනාව	51,250.00	-
17	MCA දීමනාව	352,080.00	-
18	ඉන්ධන දීමනාව	607,960.00	-
19	5000 මාසික දීමනාව	215,000.00	-
20	අධ්‍යයන දීමනාව	2,688,348.19	-
21	ප්‍රවාහන දීමනාව	600,000.00	-
22	විශේෂ දීමනාව	488,374.84	-
23	අග්‍රහාර	3,600.00	-
24	මුද්දර ගාස්තු	-	1,000.00
25	අතිකාල ගි/අ.	225,598.16	-
26	ගෞරව ගෙවීම්	348,979.95	-
27	සැපයුම් සහ අවශ්‍යතා - ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	130,204.10	-
28	සැපයුම් සහ අවශ්‍යතා-වෙනත්	38,688.05	-
29	ආරක්ෂක වියදම්	552,092.63	-
30	ප්‍රවාහන ගාස්තු	35,774.00	-
31	මුද්‍රණ සහ වෙළඳ දැන්වීම්	228,682.00	-
32	විශේෂ සේවා සහා සහ රැස්වීම	414,000.00	-
33	සන්නිවේදන වියදම්	51,530.36	-
34	විනෝදාස්වාද වියදම්	43,857.50	-
35	බැංකු ගාස්තු	1,466.09	-
36	තැපැල් ගාස්තු	21,340.00	-
37	රජයේ ප්‍රදාන පුනරාවර්තන	-	8,000,000.00
38	සමුච්චිත ක්ෂයවීම්-කාර්යාල උපකරණ	-	439,554.70
39	ක්ෂය වීම්	364,013.40	-
40	විවිධ අත්තිකාරම්	-	-
41	වෙනත් අය	-	-
42	ගෙවිය යුතු - ඇල්ෆා	-	-
43	පාරිතෝෂික දීමනාව	-	6,380,933.00
44	සමුච්චිත අරමුදල් ගිණුම	-	522,363.42
45	ගෙවිය යුතු බදු	-	-
46	සුළු මුදල්	-	-

	විස්තරය	හර	බැර
47	සේ.අ.අ.	181,991.78	-
48	අධිගෙවීම	-	-
49	විනෝදාස්වාද දීමනාව	459,135.09	-
50	වැටුප් පාලන ගිණුම	-	-
51	භාහිර දේශන ගාස්තු	971,250.00	-
52	MSc ESS වැඩසටහන	-	-
53	ලියාපදිංචි ගාස්තුව	-	1,000,000.00
54	MSc ආදායම	-	12,600,000.00
55	MPH පාඨමාලා ගාස්තුව	-	9,000,000.00
56	වැඩමුළුවේ ආදායම	-	322,500.00
57	වෙනත් ආදායම්	-	-
58	විගණන ගාස්තුව	100,000.00	-
	එකතුව	**43,402,584.75**	**43,402,584.75**

12. <u>විගණකාධිපතිවරයාගේ වාර්තාව</u>

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } සිපිසිසී/කේඩී/ඩී/පිජිඅයිඑමඑස්/2023/01 | ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2024 මැයි 10 දින.

අධ්‍යක්ෂ

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10 හි 39(අ) ඡේදය අනුව ආදායම් හඳුනා ගැනීම සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. පාඨමාලා 02 ක් සඳහා ඉදිරි වර්ෂයට අදාළව ලැබී තිබූ රු.10,800,000 ක පාඨමාලා ගාස්තු ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් පාඨමාලා ගාස්තු ආදායම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළව වෙන් කළ යුතු සේවක පාරිතෝෂික වියදම රු.272,263 ක් වුවද, ඒ සඳහා රු.6,240,267 ක් වෙන් කිරීම හේතුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වර්ෂයේ සේවක පාරිතෝෂික වියදම හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පාරිතෝෂික සඳහා වෙන්කිරීමේ ගිණුම රු.5,968,004 ක් වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා

ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම

හෙළිදරවකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අබණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්ව් ඇති බව සහ හෙළිදරවකිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති/ විධානයට අනුව	නිරීක්ෂණ
(අ)	විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ VI වැනි පරිවේඡ්දයේ 16.5	සහකාර මූල්‍යාධිකාරී සහ සහකාර ලේඛකාධිකාරී තනතුරු සඳහා වැඩ බැලීමේ දීමනා ගෙවීමේදී වැඩ බලන නිලධාරීන් විසින් දැනට ලබන වැටුපෙන් සියයට 25 ක් ගණනය කර ගෙවීම හේතුවෙන් එකී තනතුරු සඳහා එකතුව රු.268,092 ක් වැඩිපුර ගෙවා තිබුණි.
(ආ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 980 වැනි රැස්වීම් තීරණය හා 2018 මැයි 18 දිනැති අංක UGC/L/2020 දරන වක්‍රලේඛ ලිපිය	සියලුම පශ්චාත් උපාධි ආයතනවල කළමනාකරණ මණ්ඩලයේ සම්පූර්ණ සාමාජික සංඛ්‍යාව උපරිම සාමාජිකයින් 11 දෙනෙකුට සීමා කළයුතු බවට තීරණය කර තිබුණු නමුත් 2019 සැප්තැම්බර් මස 09 වන දින ආරම්භ කරන ලද වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය 26 දෙනෙකුගෙන් සමන්විත වී තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

13. <u>විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු</u>

1.2 (අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 10 හි 39 (අ) ඡේදය අනුව ආධායම් හඳුනා ගැනීම සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. පාඨමාලා 02 ක් සඳහා ඉදිරි වර්ෂයට අදාලව ලැබී තිබූ රු. 10,800,000 ක පාඨමාලා ගාස්තු ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් පාඨමාලා ගාස්තු ආදායම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	ආයතනය විසින් මේ වනවිටත් ආයතනයේ ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තියක් පිළියෙළ කිරීමට කටයුතු යොදා ඇති අතර එය ඉදිරියේදී පැවැත්වීමට නියමිත විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත ආයතනයේ කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. 2024 වර්ෂයේ සිට ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවනු ලැබේ.
(ආ)	සමාලෝචිත වර්ෂයට අදාලව වෙන් කල යුතු සේවක පාරිපොෂික වියදම රු. 272,263 ක් වූවදල ඒ සඳහා රු. 6,240,267 ක් වෙන් කිරීම හේතුවෙන් මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශයේ වර්ෂයේ සේවක පාරිතෝෂික වියදම හා මූල්‍ය තත්වය ප්‍රකාශයේ පාරිතෝෂික සඳහා වෙන්කිරීමේ ගිණුම රු. 5,968,004 ක් වැඩියෙන් දක්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සිදු වූ අත්වැරැද්දක් මත සේවක පාරිතෝෂික වෙන් කිරීම වැඩියෙන් ගණනය කොට ගිණුම්ගත කර ඇත. 2024 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මෙම තත්වය නිවැරදි කිරීමට කටයුතු යොදනු ලැබේ.
2.2.2. (ඒ)	විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ VI වැනි පරිච්ඡේදයේ 16.5 සහකාර මූල්‍යාධිකාරී සහ සහකාර ලේඛකාධිකාරී තනතුරු සඳහා වැඩ බැලීමේ දීමනා ගෙවීමේදී වැඩ බලන නිලධාරීන් විසින් දැනට ලබන වැටුපෙන් සියයට 25 ක් ගණනය කර ගෙවීම හේතුවෙන් ඒකි තනතුරු සඳහා එකතුව රු. 268,092 ක් වැඩිපුර ගෙවා තිබුණි.	වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආරම්භයේ සිටම ස්ථීර සේවකයින් නොමැතිවීම මත, ආරම්භයේ සිටම සහකාර මූල්‍යාධිකාරී සහ සහකාර ලේඛකාධිකාරී තනතුරු සඳහා වැඩ බැලීමේ පදනම මත පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ස්ථීර සේවකයින් යොදා ගෙන ඇත. 2024.02.29 දින දක්වාම මෙම ගෙවීම් කර ඇති බැවින් 2021.10.01 සිට 2024. 02.29 දක්වා වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. යම් කිසි වැරදි ගෙවීම් නැවත ආයතනය වෙත ගෙවීම සඳහා විශ්වවිද්‍යාල සේවකයින් බැඳී සිටී. මින් ඉදිරියේදී විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ VI වැනි පරිච්ඡේදයේ 16.5 ප්‍රකාරව පමණක් වැඩ බැලීමේ දීමනා ගෙවනු ලැබේ.
(ආ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 980 වැනි රැස්වීම් තීරණය හා 2018 මැයි 18 දිනෙති අංක UGC/L/2020 දරන වක්‍රලේඛ ලිපිය. සියලුම පශ්චාත් උපාධි ආයතනවල කළමනාකරණ මණ්ඩලයේ සම්පූර්ණ සාමාජික සංඛ්‍යාව උපරිම සාමාජිකයින් 11 දෙනෙකුට සීමා කලයුතු බවට තීරණය කර තිබුණු නමුත් 2019 සැප්තැම්බර් මස 09 වන දින ආරම්භ කරන ලද වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය 26 දෙනෙකුගෙන් සමන්විත වී තිබුණි.	2019. 09.09 දින සිට ක්‍රියාත්මක වුනු 2019 අංක 03 දරන වෛද්‍ය විද්‍යා පෂ්චාත් උපාධි ආයතනයේ නියමාවලියට අනුව ආයතනයේ කළමනාකරණ මණ්ඩලය පිහිටුවන ලැබීය. එබැවින් වෛද්‍ය විද්‍යා පෂ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය 26 දෙනෙකුගෙන් සමන්විත විය. තවදුරටත් මෙම අදාළ කරුණ අධ්‍යක්ශක මණ්ඩලයේ අවධානයට යොමු කර ඊට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි.